# යාපහුව රාජධානියේ අගයන් පිළිබඳ විමසුමක්

එස්.පී. වාසනා සම්පත්[56]

යාපහුව පැරණි නගරය කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇත. 13 වැනි සියවසේ සිට වසර 11ක් පමණ කාලය තුළ මෙම රාජධානියක් පැවතිනි. සුභ නම් සෙනෙවියෙකු කාලිංග මාඝට ආක්‍රමණයෙන් පසු ව මෙහි වාසය කර ඇත. පර්වතාශ්‍රිත නගරයක් වන මෙය ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ජනාවාස වූ බවට සාදක ද පවතී. යාපහුව රාජධානිය පොළොන්නරු යුගයේ පශ්චාත් අවධියේ දී නගරයක් ලෙස වර්ධනය වූ බව පුරාවිද්‍යාඥයන්ගේ මතය වේ. දඹදෙණි, කෝට්ටේ, සීතාවක, ගම්පල රාජධානි වලට පෙර යාපහුව රාජධානිය පැවත තිබේ. යාපහුව රාජධානිය තුළ ස්වාභාවික උරුමය හා සංස්කෘතික උරුමය ලෙස හඳුනාගත හැකි උරුමයන් තිබේ. යාපහුව රාජධානිය වූ කලි මානවයා විසින් නිර්මාණය කරණු ලැබූ අතීතයට අයත් ස්මාරක හා ගොඩනැගිලි සංකීර්ණ ඓතිහාසික භූමි සෞන්දර්යාත්මක නිර්මාණ හා විද්‍යාත්මක හා මානව විද්‍යාත්මක අගයන් ගෙන් හෙබි සංස්කෘතික උරුමයට අයත් අගයන් හඳුනා ගත හැකි භූමියකි. එහි නිශ්චල සංස්කෘතිමය උරුමය සතු හැකි අගයන් අතර ආශ්චර්යමය හැඟීම්, අනන්‍යතා අගය, චිරස්ථායි අගය, නෛමිතික අගය ගැබ්ව පවතී. සංස්කෘතික අගය යටතේ ඓතිහාසික අගය, පුරාවිද්‍යාත්මක අගය, වාස්තුවිද්‍යාත්මක අගය, සෞන්දර්යාත්මක අගය, විද්‍යාත්මක හා තාක්‍ෂණික අගය, ලේඛනගතමය අගය හා නාගරික භූ දර්ශන අගය ලෙස හඳුනාගත හැකි ය. තව ද මෙකී අගයන් ආරක්‍ෂාකර ගැනීම කෙරෙහි මූලික අවධානය යොමුකරමින් කටයුතු සිදුකිරීම වර්තමාන පුරාවිද්‍යාඥයන්ගේ හා පරේෂකයන්ගේ වගකීම වේ. මෙම වටිනා උරුමස්ථානයේ පුරාවිද්‍යාත්මක අවශේෂ ඉදිරි පරම්පරාවට ආරකෂා කරදීම සඳහා මෙම ස්ථානයේ අගයන් පිළිබඳව මෙම පර්යේෂණයේදී අධ්‍යයනය කර ඇත.

ප්‍රමුඛ පදඃ යාපහුව රාජධානිය,ඓතිහාසිකත්වය,අගයන්

[56] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.